# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/2/9/1/ DO - XV | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.03. 21 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

ලේකම්(ප්‍රධාන/ අධ්‍යාපන/කෘෂිකර්ම/ ධීවර/ ක්‍රීඩා) අමාත්‍යාංශය,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන,සැලසුම්,ඉංජිනේරු සේවා),

සියලුම දෙපාර්තමේන්තුගත ප්‍රධානීන්,

දකුණු පළාත.

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව පළාත් සංවර්ධන නිලධාරී සේවාවන් යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/13/01/60 හා 2022.03.03 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2021 හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය 04/2020 දරණ චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2022.02.24 දාතමින් ගරු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2021 ට අනුව, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා ඇත.

03. ඒ අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු වීමට අපේක්ෂිත දකුණු පළාත් සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය 04/2020 හි දක්වා ඇති සියලුම ලේඛන එම චක්‍රලේඛයේ දැක්වෙන ඇමුණුම්හි සඳහන් අනුපිළිවෙළ අනුව සකසා නිසි නිල මඟින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

04. තවද මෙ සියළු ලේඛන ආයතන ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කල යුතු වන අතර අදාල අයදුම්පත සමඟ උක්ත චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව සම්පූර්ණ කර ඇති බවටත් අදාල සියළු ලියවිලි අමුණා ඇති බවටත් ආයතන ප්‍රධානියා විසින් සහතික කර ඉදිරිපත් කල යුතු වේ.

05. අසම්පූර්ණ අයදුම්පත් එවීමෙන් සිදු වන ප්‍රමාදය හා නාස්තිය සඳහා අදාල ආයතන වගකිව යුතු වන බැවින් යථෝක්ත චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් සියළුම ඇමුණුම් ද සහිතව එවීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.


| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office | 091 4119011 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site | www.cs.sp.gov.lk |
|---|---|---|---|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/06-05/03/2015

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2020.01.30

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2020

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් දරන නිලධාරියකු විසින් කරනු ලබන ඉල්ලීමක් අනුව මධ්‍යම රජයේ අනුරූපී තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම</u>

මධ්‍යම රජයේ තනතුරකට අනුරූපී පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර පත්වීමක් දරණ හෙද, පරිපූරක, අතුරු වෛද්‍ය හා ගුරු සේවය වැනි මධ්‍යම රජය යටතේ මූලික පුහුණුව ලබාදීමෙන් පසු පළාත් රාජ්‍ය සේවයේ පත්වීමක් ලද නිලධාරියකුගේ හෝ සංවර්ධන නිලධාරි සේවය යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීමක් ලද නිලධාරියකුගේ ඉල්ලීම අනුව එම නිලධාරියා මධ්‍යම රජයේ තනතුරක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බඳවා ගැනීමේ බලතල පවරන ලද පත්වීම් බලධරයකු විසින් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව ස්ථාන මාරු කරනු ලැබිය හැක්කේය.

02. පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන පළමු ඡේදයේ විස්තර කර ඇති පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු පමණක් පළාත් රාජ්‍ය සේවයේ තනතුරට අනුරූපී මධ්‍යම රජයේ තනතුරකට පත්කිරීමට සුදුසුකම් ලබන්නේය.

i. පළාත් රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ නිලධරයින් හා තාක්ෂණික මට්ටමේ විශේෂ ශ්‍රේණියේ නිලධරයින් මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මධ්‍යම රජයේ තනතුරක් සඳහා පත් කළ නොහැක්කේය.

ii. නිලධරයාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ආරම්භ කිරීමට සූදානමක් හෝ නොමැති විය යුතුය.

iii. පළාත් රාජ්‍ය සේවයේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපැවතිය යුතුය.

iv. අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එම නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදා හැරීමට එකඟතාවය ලබා දී තිබිය යුතුය.

v. නිලධාරියා විසින් නව පත්වීම් බලධරයාගේ එකඟතාවය ලබා ගැනීමට පෙර මෙම චක්‍රලේඛයේ විධිවිධාන වලට එකඟව මධ්‍යම රජයේ තනතුර භාරගනු ලබන බවටත් දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට එකඟ වන බවටත් වන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුත්තේය.

03. එලෙස ස්ථාන මාරු කරනු ලබන නිලධාරියකුගේ ජ්‍යෙෂ්ඨතාවය නිලධාරියා පළාත් රාජ්‍ය සේවයේ තනතුරට බඳවා ගනු ලැබූ දිනයේදී මධ්‍යම රජය යටතේ තනතුරකට බඳවා ගනු ලැබූවායැයි සලකා තීරණය කළ යුතුය. එලෙස වුවද, ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන්නාවූ හෝ පූරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළ තනතුරකට උසස් කරනු ලබන්නාවූ හෝ පරීක්ෂණයක් සඳහා පහත සඳහන් අවස්ථාවලදී හැර මධ්‍යම රජයේ තනතුරකට අන්තර්ග්‍රහණය කර වසර තුනක් (03) යන තුරු සුදුසුකම් නොලබන්නේය.

i. ලිඛිත පරීක්ෂණයක කුසලතාවය අනුව උසස් කරනු ලබන අවස්ථාවකදී
ii. සාමාන්‍ය කාර්යසාධනය යටතේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කරනු ලබන අවස්ථාවකදී
iii. උසස් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී
iv. ස්ථාන මාරු නොවී දිගටම පළාත් රාජ්‍ය සේවයේ තනතුරෙහි රැඳී සිටියේ නම් සුදුසුකම් ලබන්නාවූ මධ්‍යම රජයේ තනතුරක් සඳහා හෝ දීප ව්‍යාප්ත සේවාවක් සඳහා හෝ සීමිත හෝ කුසලතා ධාරාව යටතේ ඉල්ලුම් කරන අවස්ථාවකදී

04. පළාත් රාජ්‍ය සේවය හා මධ්‍යම රජයේ රාජ්‍ය සේවය එකිනෙකට වෙනස් සේවාවන් වන බැවින් මෙවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් පත්වීම් බලධරයා හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අන්‍යෝන්‍ය එකඟතාවයක් අනුව කටයුතු කළ යුත්තේය.

05. ඉහත පරිදි ස්ථාන මාරු කරනු ලබන නිලධරයකුගේ පත්වීම් බලධරයා හා විනය බලධරයා වෙනස් වන බැවින් අදාළ වන්නා වූ නව සේවා කොන්දේසි සහිතව පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව රජයේ සේවයේ තනතුරකට අන්තර්ග්‍රහණය කරනු ලබන බවට ලිපියක් නිකුත් කළ යුත්තේය.

06. මෙම විධිවිධානයන් ප්‍රසිද්ධ කරනු ලැබූ දිනට පෙර පළාත් රාජ්‍ය සේවයේ සිට මධ්‍යම රජයේ තනතුරු සඳහා ස්ථාන මාරුවී සිටින පළමු ඡේදයේ විස්තර කර ඇති නිලධාරීන්ට මෙම විධිවිධානයන් අනුව රජයේ තනතුරට ස්ථාන මාරු කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ග්‍රහණය කරනු ලබන බවට ලිපියක් නිකුත් කළ යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. ජී. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2021

මගේ අංක : CS/DOS/Policy/10
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.12.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව පළාත් සංවර්ධන නිලධාරී සේවාවන් යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/3/2015 හා 2020.01.30 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 හා බැඳේ.

02. ඒ අනුව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ලැබ සිටින නිලධරයකු විසින් ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරුවීම සඳහා අපේක්ෂා කරනු ලබන අවස්ථාවකදී, ඇමුණුම 1හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍රයක් පළාත් ප්‍රධාන ලේකම් මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය. එම අයදුම්පත්‍රය සමඟ තම ආයතන ප්‍රධානියා විසින් සහතික කල ඇමුණුම් 2හි දැක්වෙන ලේඛනවල පිටපත් ද, අදාළ ඇමුණුම් අනුපිළිවෙල අනුව සකසා ඉදිරිපත් කල යුතුය.

03. ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට ස්ථාන මාරුවීම සඳහා අපේක්ෂා කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ලැබ සිටින නිලධරයෙකු පහත කොන්දේසිවලට එකඟ විය යුතු අතර ඒ බවට ශ්‍රී ලංකාව තුළ වලංගු දිවුරුම් ප්‍රකාශයක් (ඇමුණුම 3 ප්‍රකාරව) ඇමුණුම 02හි අනුඅංක 22 ලෙස ඉදිරිපත් කළ යුතුය.

(i) ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ පත්වීමක් ලද හොත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 විධිවිධාන වලට එකඟව දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟවන බවට

(ii) පළාත් සංවර්ධන නිලධාරි සේවයේ පත්කර/උසස්කර ඇති ශ්‍රේණියට අනුරූප ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව දැනට සිටින නිලධාරින් සියලු දෙනාට පසුව ජ්‍යෙෂ්ඨත්වයේ තැබීමට එකඟ බවටද

(iii) ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අනුකූල වන ශ්‍රේණිගත උසස්වීම් වලට අනුරූපී උසස්වීමක් හැර පළාත් රාජ්‍ය සේවයේ ලබා ඇති ශ්‍රේණිගත උසස්වීම් අත්හැර දැමීමට සිදුවුවහොත් එම උසස්වීම් අත්හැර දැමීමට එකඟවන බවට

(iv) පළාත් රාජ්‍ය සේවයේ ලබමින් සිටින වැටුප හා ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයට පත් කරනු ලබන ශ්‍රේණියට අනුරූප වැටුප අතර කිසියම් පරස්පරතාවයක් වේ නම් ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ සමාන්තර නිලධරයෙකු ලබන වැටුපේ පිහිටුවීමට එකඟවන බවට

04. මෙහිදී නිලධරයා ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ තනතුරකට පත්කළහොත් සේවය කිරීමට මනාපය පළ කරන සේවා ස්ථානය පිළිබඳ අයදුම්පත්‍රයේ සඳහන් කල යුතු නමුත් කිසිදු පුරප්පාඩු ලිපියක් ඉදිරිපත් නොකළ යුතුය. එසේම කිසිදු ආයතන ප්‍රධානියෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත දැනුවත් කිරීමක් නොමැතිව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු තම ආයතනයේ පවතින සංවර්ධන නිලධාරි සේවයේ පුරප්පාඩුවකට අනුයුක්ත කිරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් නොකළ යුතුය.

05. නිලධරයා ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරි සේවයේ තනතුරක සේවය කිරීමට මනාපය පළ කරනු ලබන සේවා ස්ථානයේ පුරප්පාඩු පවතීද යන්න පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් අදාළ අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් තහවුරු කර ගන්නා අතර පවතින පුරප්පාඩු අනුව එම තනතුරට නිලධරයා පත් කිරීම සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ. එකී තීරණය මත නිලධරයා අදාළ පළාත් රාජ්‍ය සේවයෙන් මුදාහැරීම/නොකිරීම සම්බන්ධ කටයුතු අදාල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

06. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලධරයා ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පත් කිරීමට එකඟත්වය පල කරනු ලබන අවස්ථාවකදී, එම නිලධරයා පළාත් සංවර්ධන නිලධාරී සේවයෙන් මුදාහැරීමට අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදෙන්නේ නම් නිලධරයා නව සේවා ස්ථානයේ වැඩ භාර ගන්නා දින සිට ක්‍රියාත්මක

වන පරිදි ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලධරයා ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයේ තනතුරකට පත් කිරීමට පළ කරනු ලබන එකඟත්වය මාසයක කාලයක් සඳහා පමණක් වලංගු වනු ඇත.

07. අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් මුදාහළ පසු එම නිලධරයා වහාම අදාළ නව සේවා ස්ථානයේ ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි තනතුරක වැඩ භාරගත යුතුය. වැඩ භාරගත් බව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කල පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අන්තර්ග්‍රහණ ලිපියක් නිකුත් කරනු ඇත.

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය සේවා, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශය

CS/DOS/Tr/PSC/04/2020

පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබ සිටින නිලධාරීන් ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරුවීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟත්වය ලබා ගැනීම

(රාජ්‍ය සේවා කොමිෂන් සභා 04/2020 චක්‍රලේඛය)

(මුල් පිටපත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුයි)

නිලධාරියාගේ පත්වීම් බලධාරීත්වය දරණ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව :- ......................................................

## I කොටස - නිලධරයාගේ ඉල්ලීම

| | | | |
|---|---|---|---|
| 01 | පෞද්ගලික තොරතුරු | | |
| I | නිලධාරියාගේ සම්පූර්ණ නම | | |
| Ii | මුලකුරු සමඟ නම | | |
| iii | උපන්දිනය | | |
| iv | ජාතික හැඳුනුම්පත් අංකය | | |
| v | ස්ථිර පදිංචිය | දිස්ත්‍රික්කය:- | |
| | | ප්‍රා.ලේ. කොට්ඨාශය | |
| vi | තාවකාලික පදිංචිය | දිස්ත්‍රික්කය:- | |
| | | ප්‍රා.ලේ. කොට්ඨාශය | |
| 02 | සේවා කාලය පිළිබඳ තොරතුරු | | |
| i | සේවා ස්ථානය | | |
| | පළාත් අමාත්‍යාංශය | | |
| | පළාත් දෙපාර්තමේන්තුව | | |
| | පත්වීම් දිනය | | |
| ii | සේවය | | |
| iii | තනතුර | | |
| iv | ශ්‍රේණිය | | |
| | දැනට ලබන වැටුපට අදාළ කේත අංකය<br>(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව) | | |
| | මාසික වැටුප | | |
| | වැටුප් පියවර | | |
| v | පත්වීම ස්ථිර කර තිබේද ( සලකුණ යොදන්න) | ඔව් | නැත |
| | ස්ථිර කළ දිනය | | |
| | පත්වීම ස්ථිර කර නොමැති නම් ඊට හේතු | | |
| vi | 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | |
| | 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | |
| | 3 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | |
| vii | දෙවන භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර තිබේද | ඔව් | නැත |
| viii | ශ්‍රේණිගත උසස් කිරීම් | II ශ්‍රේණිය | |
| | | I ශ්‍රේණිය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | වෙනත් තොරතුරු | | | | | |
| i | රාජ්‍ය සේවයේ පත්වීම් ලැබ පළාත් රාජ්‍ය සේවයට මුදා හැර ඇති නිලධාරියකුද යන්න | | ඔව් | | නැත | |
| ii | එසේ නම් මුදා හරින ලද දිනය | | | | | |
| iii | පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ දිනය | | | | | |
| 04 | ස්ථානමාරුවීමට අදාල තොරතුරු | | | | | |
| i | ස්ථාන මාරු වීමට අපේක්ෂිත ස්ථානය | අමාත්‍යාංශය | | | | |
| | | දෙපාර්තමේන්තුව | | | | |
| | | කාර්යාලය | | | | |
| | | වෙනත් | | | | |
| ii | ස්ථානමාරු ඉල්ලීමට හේතු | | | | | |

රාජ්‍ය සේවයේ තනතුරක් සඳහා ස්ථානමාරු වීමට අවස්ථාව ලදහොත් එම තනතුරේ වැඩ භාර ගත් දිනසිට ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරමි.

............................... ...............................

දිනය අත්සන

II කොටස -

ආයතන ප්‍රධානී/දෙපාර්තමේන්තු ප්‍රධානී / අමාත්‍යාංශ ලේකම් / .......................................... පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශය

- ඉහත නිලධාරියා / නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.
- මෙම නිලධාරියා / නිලධාරිණිය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග/ විගණන විමසුම් හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්, ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂාවක් නොමැති බවත් සනාථ කරමි.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2021 හි ඇමුණුම 02 අනුව මෙම නිලධාරියා සම්බන්ධ තොරතුරු හා ලේඛන ඉදිරි කටයුතු සඳහා මේ සමඟ අමුණා එවන බව කාරුණිකව දන්වමි.

................................ නිලධාරියා/නිලධාරිණිය සේවයෙන් නිදහස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

................................ ..........................................

දිනය අත්සන හා නිල මුද්‍රාව

........................................ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නිර්දේශය

................................ නිලධාරියා/නිලධාරිණිය විසින් කරන ලද ඉල්ලීම අනුව පළාත් රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

................................ ..........................................

දිනය අත්සන හා නිල මුද්‍රාව

කාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

ඇමුණුම 02

| | |
|---|---|
| නිලධාරියාගේ සම්පූර්ණ නම | |
| නිලධාරියාගේ නම (මුලකුරු සමඟ) | |

| | | | ඇමුණුම |
|---|---|---|---|
| 1 | ඒකාබද්ධ සේවය යටතේ නව තනතුරේ වැඩ භාරගත් දිනය | :-...................................... | 1 |
| 2 | .................................. පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හරින ලද දිනය | :-...................................... | 2 |
| 3 | සංවර්ධන නිලධාරී සේවයට අදාල මුල් පත්වීම් දිනය | :-...................................... | 3 |
| 4 | මුල් පත්වීමට අදාල වැඩ භාර ගැනීමේ දිනය | :-...................................... | 4 |
| (සංවර්ධන නිලධාරී සේවයට ඇතුළත්වීමට පූර්වයෙන් වෙනත් තනතුරක සේවය කර තිබේනම් ඊට අදාල පත්වීම් ලිපි හා වැඩ භාර ගැනීමේ ලිපි 03A,03B,...04A,04b,.....ලෙස අමුණා ඉදිරිපත් කරන්න) | | | |
| 5 | උප්පැන්න සහතිකය | (ඇත/නැත) | 5 |
| 6 | ජාතික හැඳුනුම්පත | (ඇත/නැත) | 6 |
| 7 | නමේ වෙනස්කම් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්/සංශෝධිත උප්පැන්න සහතිකය/ භාණ්ඩාගාර 394 යටතේ වන අනුමැතිය | (ඇත/නැත) | 7 |
| 8 | වෛද්‍ය පරීක්ෂකගේ වාර්තාව | (ඇත/නැත) | 8 |
| 9 | දිවුරුම හෝ ප්‍රතිඥාව | (ඇත/නැත) | 9 |
| 10 | වත්කම් හා බැරකම් ප්‍රකාශය | (ඇත/නැත) | 10 |
| 11 | ගිවිසුම (පොදු 160) | (ඇත/නැත) | 11 |
| 12 | යාවත්කාලීන කරන ලද චර්යා සටහන | (ඇත/නැත) | 12 |
| 13 | උපාධි සහතිකය | (ඇත/නැත) | 13 |
| 13.1 | විස්තරාත්මක ප්‍රතිඵල සටහන | (ඇත/නැත) | 13A |
| 13.2 | උපාධිය විදේශ විශ්වවිද්‍යාලයක නම් වි.වි.ප්‍ර.කො.ස විසින් පිළිගෙන ඇති බව තහවුරු කෙරෙන ලිපිය | (ඇත/නැත) | 13B |
| 13.3 | විශ්වවිද්‍යාලය විසින් උපාධිය සනාථ කරන ලද ලිපිය | (ඇත/නැත) | 13C |
| 14 | 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | (ඇත/නැත) | 14 |
| 14.1 | 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | (ඇත/නැත) | 14A |
| 14.2 | 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | (ඇත/නැත) | 14B |
| 15 | පත්වීම ස්ථිර කිරීමේ ලිපිය | (ඇත/නැත) | 15 |
| 16 | දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ඇති බව තහවුරු කිරීමට අදාල ලේඛන | (ඇත/නැත) | 16 |
| 17 | II ශ්‍රේණියට උසස්කිරීමේ ලිපිය | (ඇත/නැත) | 17 |
| 17.1 | I ශ්‍රේණියට උසස්කිරීමේ ලිපිය | (ඇත/නැත) | 17A |
| 17.2 | විශේෂ ශ්‍රේණියට උසස්කිරීමේ ලිපිය | (ඇත/නැත) | 17B |
| 18 | විනය ක්‍රියාමාර්ග (අදාල ලේඛන 18.1,18.2 ... ලෙස අමුණා ඉදිරිපත් කරන්න) | (ඇත/නැත) | 18 |

ඇමුණුම 03

## දිවුරුම් ප්‍රකාශය

මෙහි පහත අත්සන් තබන..........................................................................(ලිපිනය) දරණ ස්ථානයෙහි පදිංචි ..........................................................................(නම) වන මම ගාම්භීර පූර්වකවද, අවංකව හා සත්‍යවාදීව පහත සඳහන් කරුණු සහතික කොට දිවුරා ප්‍රකාශ කරමි/ ප්‍රතිඥා දෙමි.

1. ඉහත නම් සඳහන් ප්‍රකාශක/ප්‍රකාශිකාව මම වෙමි.
2. මා දැනට ...............................................(පළාත) පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි තනතුරක.........................................................................................(සේවා ස්ථානය) අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවය කරමි.
3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරි තනතුරකට ස්ථානමාරු වීමට මවිසින් කරනු ලබන ඉල්ලීමට අනුව මා ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරි තනතුරකට පත් කරනු ලැබුවහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 විධිවිධාන වලට එකඟව දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති බවටත්,
4. පළාත් සංවර්ධන නිලධාරි සේවයේ පත්කර/උසස්කර ඇති ශ්‍රේණියට අනුරූප ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව දැනට සිටින නිලධාරින් සියලු දෙනාට පසුව ජ්‍යෙෂ්ඨත්වයේ තැබීමට එකඟ බවටත්,
5. ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අනුකූල වන ශ්‍රේණිගත උසස්වීම් වලට අනුරූපී උසස්වීමක් හැර පළාත් රාජ්‍ය සේවයේ ලබා ඇති ශ්‍රේණිගත උස්වීම් අත්හැර දැමීමට සිදුවුවහොත් එම උසස්වීම් අත්හැර දැමීමට එකඟවන බවටත්,
6. පළාත් රාජ්‍ය සේවයේ සිටියදී ලබමින් සිටින වැටුප හා ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයට පත් කරනු ලබන ශ්‍රේණියට අනුරූප වැටුප අතර කිසියම් පරස්පරතායවක් වේ නම් ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ සමාන්තර නිලධාරියෙකු ලබන වැටුපේ පිහිටුවීමට එකඟවන බවටත්,

මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි/ප්‍රතිඥා දෙමි.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දෙමි.

මුද්දරය

ප්‍රකාශක/ප්‍රකාශිකාව ගේ අත්සන

මෙම දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කරුණු කියවා තේරුම් කරදීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන වර්ෂ 20.... ක් වූ ......................මස ........... වන දින මා ඉදිරිපිටදී ..........................................(ස්ථානය)දී අත්සන් තබන ලදී.

..........................................

සාමදාන විනිශ්වයකාර තැන